දැන්වීමයි.

<u>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ</u>

<u>පරිගණක මෘදුකාංග සංවර්ධක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2025</u>

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරිගණක මෘදුකාංග සංවර්ධක තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. බඳවා ගැනීමේ ක්‍රමය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල අනුව බඳවාගනු ලැබේ.

## 02. අවශ්‍ය සුදුසුකම්

I. **අධ්‍යාපන සුදුසුකම් :**

(1). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

(2) i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)

සහ

ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(3) i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම.

සහ

ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II) වෘත්තීය සුදුසුකම් :

ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

III) පළපුරුද්ද :

ක්ෂේත්‍රයෙහි පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

IV) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

V) වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට බඳවාගැනීම සඳහා වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

මෙම තනතුර තාවකාලිකය. වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

04. වයස් සීමාව

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි විය යුතුය.

05. මාසික දීමනාව

රු.88,000+17,800ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

06. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පරිපාටිය පදනම් කරගනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>i. පශ්චාත් උපාධිය - 10<br>ii. පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 05,<br>iii. මෘදුකාංග සංවර්ධනය පිළිබඳ වෘත්තිය සහතික - 02 | 10 | අදාල නොවේ. |

| | | |
|---|---|---|
| තනතුරට අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද<br>Java හෝ Angular2 මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ,<br>i. වසර 01ක පළපුරුද්ද - ලකුණු 02<br>ii. වසර 1- 2 දක්වා පළපුරුද්ද - ලකුණු 05<br>iii. වසර 2- 3 දක්වා පළපුරුද්ද - ලකුණු 07<br>iv. වසර 3කට වැඩි පළපුරුද්ද - ලකුණු 10 | 10 | අදාල නොවේ. |
| ව්‍යුහගත පරීක්ෂණය<br>(පහත විෂය ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රශ්න 05ක් විමසනු ලැබේ. එක් ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් හිමිවේ.)<br>i. මෘදුකාංග ඉංජිනේරු සංකල්ප<br>ii. API Management<br>iii. දත්ත කළමනාකරණ පද්ධති (Relational and non-Relational Data Base Management System)<br>iv. PHP/Java වැඩසටහන්කරණය සහ නිර්මාණකරණය<br>v. Angular2 Front-End සංවර්ධන කුසලතා | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාව | 05 | |
| මුළු ලකුණු | 50 | |

ව්‍යුහගත පරීක්ෂණයේදී, තොරතුරු තාක්ෂණය සහ පද්ධති සංවර්ධනයට අදාල ප්‍රශ්නාවලියක් අයදුම්කරුවන් වෙත යොමු කෙරේ.

6.1 අයදුම්කරුවන් විසින් යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| a) මෘදුකාංග සංවර්ධනය පිළිබඳ නිපුණතාවය<br>b) API Management පිළිබඳ නිපුණතාවය<br>c) දත්ත කළමනාකරණ පද්ධති ((Relational and non-Relational Data Base Management System) පිළිබඳ නිපුණතාවය<br>d) PHP/Java වැඩසටහන්කරණය සහ නිර්මාණකරණය පිළිබඳ නිපුණතාවය<br>e) Angular2 Front-End සංවර්ධනය පිළිබඳ නිපුණතාවය | 20 | 10 |
| මෘදුකාංග තත්ත්ව සහතිකකරණය පිළිබඳ නිපුණතාවය | 05 | 2.5 |
| මුළු ලකුණු | 25 | 12.5 |

අයදුම්කරුවන් විසින් තාක්ෂණික වෘත්තීය පරීක්ෂණයේදී හා යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්කිරීම් බලධරයා විසින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

**08. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පරිගණක මෘදුකාංග සංවර්ධක තනතුරට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2025" යනුවෙන් සඳහන් කල යුතු අතර, අයදුම්පත් **2025.03.17** දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.

අයදුම්පතෙහි ආකෘතිය, ලකුණු ලබාදීමේ පරිපාටිය හා වැඩි විස්තර සඳහා http://www.pensions.gov.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවනු ලබන අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

Achami

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

චාමින්ද හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත - කොළඹ 10

## ආදර්ශ අයදුම්පත්‍රය

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ
## පරිගණක මෘදුකාංග සංවර්ධක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(අදාළ අංකය කොටුව තුල ලියන්න. සිංහල - 2/දෙමළ - 3)

| |
|---|

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)

---

(1) සම්පූර්ණ නම :

(2) ස්ථිර පදිංචි ලිපිනය :

(3) ස්ත්‍රී/පුරුෂ භාවය :

(4) විවාහක/අවිවාහක බව :

(5) I. උපන් දිනය : II. වයස :අවුරුදු ........... මාස .......... දින ............

(6) ජාතික හැඳුනුම්පත් අංකය :

(7) දුරකථන අංක - ස්ථාවර : ජංගම:
විද්‍යුත් තැපැල් ලිපිනය:

(8) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 02 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර

| සුදුසුකම | ලබාගත් ආයතනය | ලබාගත් දිනය/කාල සීමාව |
|---|---|---|
| 1. අධ්‍යාපන සුදුසුකම් | | |
| I .............................. | ........................ | ............................... |
| II............................. | ........................ | ............................... |
| III............................ | ........................ | ............................... |
| 2. වෘත්තීය සුදුසුකම් | | |
| I .............................. | ........................ | ............................... |
| II............................. | ........................ | ............................... |
| III............................ | ........................ | ............................... |
| 3. පළපුරුද්ද | | |
| I .............................. | ........................ | ............................... |
| II............................. | ........................ | ............................... |
| III............................ | ........................ | ............................... |

4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව

I ……………………………..   ……………………   ……………………………..

II……………………………   ……………………   ……………………………..

III…………………………   ……………………   ……………………………..

**(9)** අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, තොරතුරු බව සහතික කරන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන සියළු විධිවිධානයන්ට මම යටත් වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

.....................................   .....................................

දිනය   අයදුම්කරුගේ අත්සන

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ**

**පරිගණක මෘදුකාංග සංවර්ධක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම**

**විස්තරාත්මක ලකුණු පටිපාටිය - යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය (මුළු ලකුණු 50)**

1) අතිරේක අධ්‍යාපන සුදුසුකම් - **උපරිම ලකුණු 10**
   a) පශ්චාත් උපාධිය - ලකුණු 10
   b) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 05
   c) මෘදුකාංග සංවර්ධනය පිළිබඳ වෘත්තීය සහතික - ලකුණු 02
   (තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි වූ ආයතනයක් මගින් නිකුත් කරන ලද)
   *උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

2) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද: **උපරිම ලකුණු 10**
   Java හෝ Angular 2 මෘදුකාංග ඉංජිනේරුකරණය පිළිබඳ,
   a) වසර 1ක පළපුරුද්ද - ලකුණු 02
   b) වසර 1-2 දක්වා පළපුරුද්ද - ලකුණු 05
   c) වසර 2-3 දක්වා පළපුරුද්ද - ලකුණු 07
   d) වසර 3කට වැඩි පළපුරුද්ද - ලකුණු 10

3) ව්‍යුහගත පරීක්ෂණය : **උපරිම ලකුණු 25**
   (පහත විෂය ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රශ්න 05ක් විමසනු ලැබේ. එක් ප්‍රශ්නයකට ලකුණු 05 බැගින් හිමිවේ.)
   i. මෘදුකාංග ඉංජිනේරු සංකල්ප
   ii. API Management
   iii. දත්ත කළමනාකරණ පද්ධති (Relational and non-Relational)
   iv. PHP/Java වැඩසටහන්කරණය හා නිර්මාණකරණය
   v. Angular2 Front-End සංවර්ධන කුසලතා

   එක් එක් ප්‍රශ්නයට අදාළ ලකුණු ලබාදීමේදී පහත නිර්ණායකයන් පිළිබඳව සැළකිලිමත් වේ.
   - සංකල්පය පැහැදිලි කිරීම - ලකුණු 02
   - යෙදුම් (Application) භාවිතය පැහැදිලි කිරීම - ලකුණු 02
   - නිවැරදිව ඉදිරිපත් කිරීම - ලකුණු 01

4) සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාව : **ලකුණු 05**
   - නායකත්ව කුසලතා - ලකුණු 02
   - සන්නිවේදන කුසලතා - ලකුණු 02
   - පෞරුෂත්වය - ලකුණු 01

**විස්තරාත්මක ලකුණු පටිපාටිය - වෘත්තීය පරීක්ෂණය (මුළු ලකුණු 25)**

1) මෘදුකාංග සංවර්ධනය පිළිබඳ නිපුණතාවය : **ලකුණු 20**
   i) මෘදුකාංග සංවර්ධනය පිළිබඳ නිපුණතාවය
   ii) API Management පිළිබඳ නිපුණතාවය
   iii) දත්ත කළමනාකරණ පද්ධති (Relational and non-Relational) පිළිබඳ නිපුණතාවය
   iv) PHP/Java වැඩසටහන්කරණය සහ නිර්මාණකරණය පිළිබඳ නිපුණතාවය
   v) Angular2 Front-End සංවර්ධනය පිළිබඳ නිපුණතාවය

2) මෘදුකාංග තත්ත්ව සහතිකකරණය පිළිබඳ නිපුණතාවය : **ලකුණු 05**